Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාවය - 9.0 තොරතුරු ලබා ගැනීම සඳහා සරල දත්ත සමුදා නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම - 9.3 දත්ත සමුදා කළමණාකරණ මෘදුකාංග භාවිතයෙන් සම්බන්ධිත දත්ත සමුදා නිර්මාණය කරයි.

පෙළ පොතෙහි 279 පිටුවෙහි සිට 288 පිටුව දක්වා අධ්‍යයනය කර පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01. අප කලින් නිර්මාණය කරන ලද රෝහලක රෝගීන්ගේ වගුවද සම්බන්ධ කර ගනිමින් රෝහලකට අදාල දත්ත සමුදාය නිර්මාණය කරමු.

රෝගීන්ගේ වගුව, වෛද්‍යවරයා වගුව, වාට්ටුව වගුව ට අදාල වන ලෙස වගු නිර්මාණය කරන්න.

එක් රෝගියෙක් සඳහා වෛද්‍යවරු කිහිපදෙනක් වෙන් වී සිටී. එක් වෛද්‍යවරයෙක් හට රොගීන් කිහිපදෙනෙක් සිටී. එක් රෝගියෙක් හට ඇතුලත් විය හැක්කේ එක් වාට්ටුවකට පමණි. එක් වාට්ටුවක රෝගීන් බොහොමයක් සිටිය හැක. එක් වෛද්‍යවරයකුට සම්බන්ධ විය හැක්කේ එක් වාට්ටුවකට පමණක් වන අතර වාට්ටුවක වෛද්‍යවරුන් කිහිප දෙනෙක් සිටිය හැක.

ඉහත ලබා දී ඇති විස්තරයද සලකා බලමින් ප්‍රාථමික යතුරු, ආගන්තුක යතුරු හා වගු නිසි ලෙස යොදා ගනිමින් සම්බන්ධිත දත්ත සමුදායක් නිර්මාණය කර සුදුසු මෘදුකාංගයක් යොදා ගනිමින් ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායක් බවට පරිවර්තනය කරන්න.